1287

# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - නුවරවැව

වතිවිட திட்ட முகாமையாளர் காரியாலயம் – நுவரவெவ

**Resident Project Management Office - Nuwarawewa**


වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

නුවරවැව, යාපනය පාර,
පුලියන්කුලම, අනුරාධපුර
நுவரவெவ, யா
புளியன்குலம், அநுராதபுரை
Nuwarawewa,Jaffna,
Puliyankulam, Anurndhapura


18 MAR 2019

මගේ අංකය / எனது இல. / My Ref No: 026/03/02

ඔබේ අංකය / உமது இல. / Your Ref No:

දිනය / திகதி / Date: 2019.03 11

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

<u>2019 පෙබරවාරි මස 21 වන දින ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව</u>

නුවරවැව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 පෙබරවාරි මස 21 වන දින පෙ.ව.09.30 ට පමණ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම නුවරවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී. පැමිණ සිටි සියලු දෙනා නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ පිළිගැනීමෙන් හා ආගම සිහි කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | ටී.එම්.පී තෙන්නකෝන් | නේවාසික ව්‍යාපාර කළමනාකරු | නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 2 | එස්.ඩබ්.එස් සෙනවිරත්න | සංවර්ධන නිළධාරි | ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 3 | ඩී.ජී.ඒ.මධුෂාන් | ඉංජිනේරු සහකාර | වාරිමාර්ගදෙපාර්තමේන්තු |
| 4 | පී.බී.සී.එස්.කුලතුංග | තාක්ෂණ සහයක | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 5 | ආර්.එම්.ඒ.එස් වැගොඩපොල | තාක්ෂණ සහකාර | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 6 | එන්.පි චන්ද්‍රසේකර | කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර | ගොවිජනසේවා මධ්‍යස්ථානය සාලියපුර |
| 7 | ඩබ්.ආර්.එස්.ජී.සී.සේනාධීර | කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර | ගොවිජනසේවා මධ්‍යස්ථානය සාලියපුර |
| 8 | ඩබ්.ජී.එස් වසන්තා | කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර | ගොවිජනසේවා මධ්‍යස්ථානය සාලියපුර |
| 9 | රේණුකා සෙනවිරත්න | කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර | ගොවිජනසේවා මධ්‍යස්ථානය සාලියපුර |
| 10 | එම්.ජී.අයි.මල්ලවආරච්චි | කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර | ගොවිජනසේවා මධ්‍යස්ථානය සාලියපුර |

සහභාගි වූ ගොවිසංවිධාන නිලධාරීන්

| අනු අං. | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 1 | පූජ්‍ය රත්ගම සමිත හිමි | ගරු සභාපති | ජයවැව ගොවි සංවිධානය |
| 2 | පී.බී.අධිකාරි | ගරු ලේකම් | පරාක්‍රම ගොවි සංවිධානය |
| 3 | ඩී.එම්.පී දිසානායක | ගරු ලේකම් | එකමුතු ගොවි සංවිධානය |
| 4 | ඩබ්.එන්.එස් වික්‍රමසිංහ | ගරු භාණ්ඩාගාරික | පරාක්‍රම ගොවි සංවිධානය |
| 5 | ගාමිණි රාජරත්න | ගරු සභාපති | සාරභූමි ගොවි සංවිධානය |
| 6 | එච්.බී.ආරියදාස | ගරු සභාපති | රංකෙත ගොවි සංවිධානය |
| 7 | පී.අබේපාල | ගරු භාණ්ඩාගාරික | රංකෙත ගොවි සංවිධානය |
| 8 | ජේ.එම්.එස්.බංඩාර | ගරු සභාපති | විජය ගොවි සංවිධානය |
| 9 | ඩබ්.එම්.සෙනවිරත්න | ගරු ලේකම් | එක්සත් ගොවි සංවිධානය |
| 10 | එම්.ගාමිණී පෙරේරා | ගරු ලේකම් | පැරකුම් ගොවි සංවිධානය |
| 11 | කේ.ඒ.එන්.සිල්වා | ගරු භාණ්ඩාගාරික | පැරකුම් ගොවි සංවිධානය |
| 12 | එන්.ප්‍රේමලතා | ගරු භාණ්ඩාගාරික | සාලිය ගොවි සංවිධානය |
| 13 | ආර්.එම්.ජයවර්ධන | ගරු ලේකම් | සාලිය ගොවි සංවිධානය |
| 14 | ටී.ඒ.කුමාරදාස | ගරු භාණ්ඩාගාරික | එකමුතු ගොවි සංවිධානය |
| 16 | ඩබ්.එම්.මුණසිංහ | ගරු සභාපති | පරාක්‍රම ගොවි සංවිධානය |
| 15 | එන්.ඒ.කරුණාරත්න | උප ලේකම් | සාලිය ගොවි සංවිධානය |

**01.ලිපි ඉදිරිපත් කිරීම**

**01.**වාරිමාර්ග කළමනාකරණ අධ්‍යක්ෂ තුමිය විසින් එවන ලද මහාවාරි වැව් වල පිරිත් දේශනා පැවැත්වීම පිළිබඳ සඳහන් ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.
**02.** 2018 යල් අස්වනු පූජාව සඳහා සිදුකරන ලද වියදම් ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලදි.

**01.ආයතන සංවර්ධන - සංවර්ධන නිලධාරි - එස්.ඩබ්.එස්.සෙනවිරත්න මහතා**

01. 1

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| කාරකසභා | 06 |
| නිලවරණ මහසභා | 05 |

2018 මහ කන්නය සඳහා සිදු කරනු ලබන කිරි ඉතිරවීම 2019.04.03 වන දින පැවැත්වීමට අනිවාර්යෙන් කටයුතු සිදුකල යුතු බවට ගොවි සංවිධාන නිලධාරීන් දැනුවත් කරන ලදි.

**03. ජල මෙහෙයුම් කටයුතු.**
**වාරිමාර්ග කටයුතු - ඉංජිනේරු සහකාර - ඩී.ජී.ඒ.මධුෂාන් මහතා**

ජල ධාරිතාවය අක්කර අඩි 31500 - අඩි 21.4

නුවර වැවෙහි වම් ඉවුර බෝක්කුව මේ වන විට සුද්ද කර අවසන් බව ප්‍රකාශ කලහ.

පරාක්‍රම ගොවි සංවිධාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රඳවා ඇති රැඳවුම් මුදල ලබා දීමට කටයුතු කරන බව සඳහන් කලේය.

## 3.1ගොවි සංවිධාන ගැටළු ඉදිරිපත් කිරීම

| විෂය | ගැටළුව හා පිළිතුර | වගකීම |
|---|---|---|
| මෙහෙයුම් නඩත්තු | ❖ විජය ගොවි සංවිධානයේ දොරවල් 2 ක් අස්ථාන ගතවී ඇති බවත් එකමුතු ගොවි සංවිධානයේ ඩී 4 ඇලෙහි අස්ථාන ගත වූ දොර නැවත සවි කිරීම සඳහා අළුත් දොරක් මේ වන විට ලැබී ඇති බවත් මෙම දොරවල් නැති වීම විශාල ගැටළුවක් බවට පත් වී ඇති අතර මේ පිළිබඳව ගොවි සංවිධාන වගකීම භාර ගත යුතු බව තාක්ෂණ සහයක **පී.බී.සී.එස්.කුලතුංග මහතා** ප්‍රකාශ කරන ලදී. | ගො.සං. වා.දෙ |
| | ❖ විජය ගොවි සංවිධානයේ රේල් පාර අසල ඇති බෝක්කුව අළුත් වැඩියා කල යුතු බව සහ 8 කණුව ලඟ ඇති බෝක්කුවෙන් ජලය අපතේ යාම සඳහා පිළියම් යෙදිය යුතු බවත් මැද ඇල ශුද්ධ කර දෙන ලෙසත් විජය ගොවි සංවිධාන සභාපති ජේ.එම්.එස්.බංඩාර මහතා විසින් ඉල්ලා සිටින ලදී.<br>**තාක්ෂණ සහයක පී.බී.සී.එස්.කුලතුංග මහතා**<br>ඇලවල් වල ජලය නිකුත් කිරීම පිළිබඳව මිනුම් ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතින බවත් ඉදිරියේදී එය ක්‍රියාත්මක කරන බවත් ප්‍රකාශ කලේය. | වා.දෙ |
| | ❖ ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය හා බතලගොඩ වී පර්යේෂණ ආයතනය සම්බන්ධවී පරාක්‍රම ගොවි සංවිධානයේ සිදුකරන ලද තෙත් හා වියළි ක්‍රමය යටතේ වී වගාව සිදු කිරීමේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා පුලියන්කුලම වැවට 2019 යල කන්නය ආරම්භ කිරීමට පෙර ජල මාපකයක් සවිකර දෙන ලෙස<br>❖ රක්ෂිත වෙන් කිරීම සඳහා ගල්කණු 100 ක් පමණ ලබා දෙන ලෙස පරාක්‍රම ගොවි සංවිධාන ලේකම් පී.බී අධිකාරි මහතා ඉල්ලා සිටින ලදී. | වා.දෙ |
| | ❖ පැරකුම් ගොවි සංවිධානයට අයත් හතරැස්වෙල ඇලෙහි ගැටලුවක්ව ඇති නුග ගස ඉවත් කිරීමට කටයුතු කල යුතු බව පැරකුම් ගොවි සංවිධාන භාණ්ඩාගාරික කේ.ඒ.එන්.සිල්වා මහතා විසින් ඉල්ලා සිටින ලදී.<br>**තාක්ෂණ සහයක පී.බී.සී.එස්.කුලතුංග මහතා**<br>ගස් ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කර අවසර ලබා ගත යුතු බව පෙන්වා දෙන ලදී. | වා.දෙ |

**අදහස් දැක්වීම- නේවාසික ව්‍යාපෘති කළමනාකරු**

2018/19 මහ කන්නය සඳහා ජලය නිකුත් කිරීම මේ වන විට අවසන් වී ඇති බවත් දැනට වගාවේ පවතින තත්වය අනුව ජල අවශ්‍යතාවය පිළිබඳව ගොවි සංවිධාන මට්ටමින් අදහස් විමසා සිටින ලදී.

| ගොවි සංවිධානය | ජලය අවශ්‍ය අක්.ප්‍රමාණය | ජලමුර ප්‍රමාණය |
|---|---|---|
| පරාක්‍රම | 05 | 01 |
| සාලිය | 160 | 02 |
| විජය | 93 | 02 |
| | 103 | 01 |
| රංකෙත | 70 | 01 |
| එකමුතු | 127 | 02 |
| පැරකුම් | 100 | 01 |
| | 40 | 02 |
| එක්සත් | අවශ්‍ය නැත | |
| සාරභූමි | අවශ්‍ය නැත | |
| ජයවැව | 40 | 02 |
| ඩී 123 | - | |
| මිහිඳු | - | |

... ව්‍යාපාර කළමනාකාරතුමා පෙන්වාදෙන ලදී.

**<u>4.යෙදවුම් සම්පාදනය සහ අනෙකුත් කටයුතු - සංවර්ධන නිලධාරි - ඩී.සී ලියනආරච්චි මයා - ගොවිජනසේවා දෙපාර්තමේන්තුව</u>**

**04.1.පොහොර සහනාධාරය**

පොහොර සහනාධාරය සඳහා ගොවි මහතුන්ගේ මුදල් ලබා දීම කඩිනමින් සිදුකල යුතු බව දැනුවත් කලේය.

ටී.එස්.පී පොහොර ලබාදීම අපහසු වූ බවත් තොග ඉල්ලීම් කරන විට තොග අවසන් වී ඇති බවත් ප්‍රකාශ කලේය. ටී.එස්.පී වෙනුවට යූරියා ලබා දීම ගැටලුවක් බවට පත්ව ඇති බව තවදුරටත් සඳහන් කලේය.

**04.2.වගා හානි**

වී වගාවට පැන නැගී ඇති කීඩෑ හානිය පිළිබඳව කෘෂි පර්යේෂණ නිලධාරිතුමිය දැනුවත් කරන ලෙස ප්‍රකාශ කලේය.

**04.3 දේශීය වී වගාව**

දේශිය වී වගාව යටතේ සුවඳැල් වගාවට කැමති ගොවි මහතුන් 100 කට අවස්ථාව සලසා දිය හැකි බවත් කැමති ගොවිමහතුන් නම් ලබා දෙන ලෙස දැනුවත් කලේය.

**4.3 ගොවි සංවිධාන ගැටලු ඉදිරිපත් කිරීම**

| විෂය | ගැටලුව හා පිළිතුර | වගකීම |
|---|---|---|
| වී අලෙවිය | ❖ වී මිල දී ගැනීම සඳහා සේනානායක ගබඩා දෙක විවෘත කර දෙන ලෙස පරාක්‍රම ගොවි සංවිධාන ලේකම් පී.බී අධිකාරි මහතා ඉල්ලා සිටින ලදී. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| | ❖ පෞද්ගලික අංශ මගින් සම්බා වී කිලෝවක් රුපියල් 30.00 ට ගෙන සුපරි සම්බා නමින් සහල් කිලෝවක් රුපියල් 120.00 ට අලෙවි කරන බවත් ඒ පිළිබඳව ඇමතිතුමා දැනුවත් කරන ලෙස ප්‍රකාශ කලේය.<br>❖ නුවරවැව ව්‍යාපාරයට වී වෙළීම සඳහා පොදු කමත් තුනක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස විජය ගොවිසංවිධාන ලේකම්එම්.ඒ වීරසිරි මහතා ඉල්ලා සිටියේය. | ගොවිජන සේවා . දෙ |

**<u>5.කෘෂිකර්ම කටයුතු - තාක්ෂණ සහකාර - ආර්.එම්.ඒ.එස්.වෑගොඩපොල මිය.</u>**

**5.1. සේනා දළඹුවා**

සේනා දළඹුවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී ගොවි සංවිධාන නිළධාරීන් ලබා දුන් සහයෝගය අගය කරන බව ප්‍රකාශ කලේය.සේනා දළඹුවා හේතුවෙන් අස්වනු හානියක් සිදුවී නොමැති බවත් නියමිත කාලයට බඩඉරිඟු වගාව සිදු කිරීමෙන් ඒ සඳහා වන හානිය අවමකරගත හැකි බවත් පෙන්වාදෙන ලදී.

**5.2.කීඩෑ හානිය**

පිටසුදු කීඩෑවා සහ දුඹුරුපැල කීඩෑවාගේ හානිය වී වගාවේ දක්නට ලැබෙන බවත් සුදු රෝග හානිය සඳහා කෘමිනාශක ලබා දී ඇති ගොයමට කීඩෑ හානිය සිදුවීමේ ඉඩකඩ ඇති බව සඳහන් කලේය.

5.3 වල් වී ශාකය

පරාක්‍රම ගොවිසංවිධානයේ ගැටලුවක්ව ඇති වල් වී ශාකය පිළිබඳව දැනුවත් කල බවත් 2019/2/22 වන දින මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ප්‍රකාශ කලේය.

06.<u>සත්ත්ව සංවර්ධන කටයුතු - සත්ව සංවර්ධන උපදේශක - අරවින්ද රත්නායක මහතා</u>

06.1 කිරිගව පාලනය

කිරි ගවයින් සඳහා කුර හා මුඛ රෝග පැමිණි නමුත් මේ වන විට එය පාලනය වී ඇති බවත් මෙම රෝගය ගොවීන්ගේ ආර්ථිකයට බලපා ඇති බවත් පෙන්වාදෙන ලදී.මෙම රෝගය සඳහා එන්නත් ලබා දීම අගෝස්තු මස සිදු කරන බව සඳහන් කලේය.

06.2 විශේෂ වැඩසටහන්
සමුපකාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සත්ව පාලනය පිළිබඳව විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතින බව පෙන්වා දෙන ලදී.

06.3 කුකුල් පාලනය
පවුලේ ප්‍රෝටීන් වැඩි කිරීමෙ අරමුණ පෙරදැරිකොටගෙන නිදැලි කුකුල් පාලන වැඩසටහනක් ක්‍රියාත්මක කරන බව පෙන්වාදෙන ලදි.

අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ස්තුති කථාවෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් විය.

.................................
වී.එම්.පී.තෙන්නකෝන්
නේවාසික ව්‍යාපාර කලමනාකරු
නුවරවැව ව්‍යාපාරය
පිටපත් -

01.අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය - කොළඹ කා/දැ/පි
02.දිස්ත්‍රික් ලේකම් - අනුරාධපුරය කා/දැ/පි
03.කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක - අ/පුර කා/දැ/පි
04.ප්‍රාදේශීය ලේකම් - නැ.නු.ප / ම.නු.ප. කා/දැ/පි
05.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) අ/පුර කා/දැ/පි